# ලූල්නෑව කුඹල් ගම්මානය ආශ්‍රිත මානව විද්‍යාත්මක අධ්‍යයනයක්.

**සෙනෙවිරත්න පී.එම්.එස්.**[1]

මානව ශිෂ්ටාචාරය තුළ දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන කුඹල් කර්මාන්තය වර්තමානය දක්වා ම නොනැසී පවතින ලාංකේය සමාජය තුළ දෛනික අවශ්‍යතා පූර්ණය කරන්නා වූ කර්මාන්තයකි. ලංකා ඉතිහාසයේ කුඹල් කර්මාන්තය පිළිබඳව බොහෝ අවස්ථාවල දී තොරතුරු හමු වේ. පුරාවිද්‍යා කැණීම් මගින් හමු වී ඇති සාධක තුළින් ශ්‍රී ලංකේය මැටි බඳුන් නිෂ්පාදනය උපරිම ස්ථානයක තිබූ බව පහැදිලි වේ. ලංකාවේ පාරම්පරික කුඹල් කර්මාන්ත පවත්වාගෙන එන ප්‍රදේශ අතරින් අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රමුඛ ස්ථානයක් ගනී. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගයේ මිහින්තලය සහ කහටගස්දිගිලිය අතර පිහිටි ලූල්නෑව ගම්මානය පාරම්පරිකව කුඹල් කර්මාන්තයේ යෙදෙන ගැමියන් ජීවත්වන ප්‍රදේශයකි. මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධියක් උසුලන මෙම ගම්මානය තුළ වර්තමානය වන විට පවුල් 60ක් පමණ එකී කර්මාන්තයේ නිරත වී සිටී. ලූල්නෑව ගම්වාසීන්ගේ වර්තමාන ජන ජීවිතය හා කුඹල් කර්මාන්තයේ ස්වභාවය පිළිබඳව මානවවංශ විද්‍යාත්මක විමර්ශනයක් සිදුකිරීම මෙම අධ්‍යනයේ අරමුණ විය. ඒ සඳහා මූලික අධ්‍යයන ක්‍රමවේද ලෙස මානවවංශ විද්‍යාත්මක විධික්‍රම යොදාගන්නා ලදි. එහි දී සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස්කරගන්නා ලදී. මෙම විධික්‍රම ඔස්සේ ලූල්නෑව ගම්මානයේ වර්තමාන සමාජය ගැඹුරින් අධ්‍යයනය කළ අතර එහි දී පරම්පරාවේ සිදුවී ඇති පරිවර්තනයන් හඳුනාගත හැකි විය. මෙහි ගැමියන් අතර ඇති ජනප්‍රවාද ලූල්නෑව කුඹල් කර්මාන්තයේ පෞරාණික බව ඉස්මතු කරනු ඇත. ලූල්නෑව ගම්වාසීන් පාරම්පරිකව ලැබුණු ශිල්ප ක්‍රමයන් ඇතුලු උරුමයන් වර්තමානයේදීත් ආරක්ෂා කරගෙන තම කර්මාන්තයේ නියැලෙන බව මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ අනෙකුත් කුඹල් ගම්මාන ආශ්‍රිතව නිෂ්පාදනය වන භාණ්ඩ සමග සැසඳීමේ දී ලූල්නෑව මැටි බඳුන් සඳහා විශේෂ ස්ථානයක් හිමිවන බව ගැමියන් පවසයි. ඒ අනුව ලූල්නෑව කුඹල් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන තාක්ෂණික ක්‍රමවේදය, සම්පත් භාවිතය, ආර්ථික රටාව, වර්තමානයේ නිෂ්පාදනය වන්නා වූ මැටි භාණ්ඩ පිළිබඳ, පරම්පරාව සම්බන්ධ වර්තමාන තත්ත්වය මෙන් ම ඉදිරි පරම්පරාවට ශිල්පය ලබා දීම හා අනාගතයේ දී ලූල්නෑව ගම්මානය තුළ පාරම්පරික ව රැගෙන ආ මෙම ශිල්පයේ රඳා පැවැත්ම කෙසේද? යන්න පිළිබඳව මෙම අධ්‍යයනයේ දී මූලික වශයෙන් අවධානය යොමුකර ඇත.

**මුඛ්‍ය පද** : ලූල්නෑව, කුඹල් කර්මාන්තය, පරිවර්තන, මානවවංශ විද්‍යාව, මැටි භාණ්ඩ

[1]පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
madhushanikumari98@gmail.com